**ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2758 - එස්ආර්අයි)**

---

ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජසජම ) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 ජූලි 22 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ සහ අතිරේක ණය ගිවිසුමේ (අ) ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජසජම) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නියෝජිතායතනය වේ. ආසියානු සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකා රජයේ දායකයද ඇතුළුව එජඩො මිලියන 85.6 ක් වූ අංක 1993-එස්ආර්අයි- (එස්එෆ්) දරන ණය ගිවිසුම 2003 අගෝස්තු 18 දින අනුමත කරන ලදි. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, 969,000 ක් වන ජනතාවට පිරිසිදු ජලය සැපයීම සහ නාගරික ප්‍රදේශ පහක හා උතුරු මැද පළාතේ ග්‍රාමීය ප්‍රදේශවල 171,500 ක් වන ජනතාවට සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සහ පිරිසිදු ජලය සැපයීම මඟින් ජල කටයුතු සම්බන්ධ ආයතන ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ධාරිතාවය වැඩි කිරීමයි. ව්‍යාපෘතියේ සැළකිය යුතු පිරිවැය ඉහළයාම් හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රධාන වැඩ, පිරිසිදු නොකල ජල සම්ප්‍රේෂණය සහ මුතුර් පවිත්‍රාගාරයේ සිවිල් වැඩ කටයුතු සඳහා අතිරේක ණය මුදලක් සැපයීමට එකඟ වී තිබුණි. අතිරේක ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 14.9 ක් වන අතර එයින් එජඩො මිලියන 13.3 ක් හෙවත් සියයට 89.26 ක් ආසියානු සංවර්ධන බංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණු අතර , එජඩො මිලියන 1.6 ක් හෙවත් සියයට 10.74 ක් මූල්‍යායනය කිරීමට ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලංර) එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2014 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා

ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ, ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් ඉස්මතු කර පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වුයේද යන බව.

**3. මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් ඉස්මතු කර පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.708,338,287 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,166,877,660 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 618,923,189 | 334,789,848 | 972,038,166 |
| උපදේශක සේවා | 18,043,803 | 58,670,926 | 155,998,453 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය | 64,402,312 | 4,263,954 | 68,666,256 |
| පොලී ගාස්තු | 6,968,983 | 3,205,793 | 10,174,776 |
| එකතුව | **708,338,287** | **400,930,521** | **1,166,877,660** |

### 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එදිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 1,059,018 | 134,665,570 |
| එකතුකළා :- ඌන පුරණයන් | - | - |
| විදේශ විනිමය වාසිය | - | 3,010,696 |
| | 1,059,018 | 137,676,266 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 477,567 | 61,649,767 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **581,451** | **76,026,499** |

## 5. විගණන නිරික්ෂණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු. 686,863 කට ප්‍රසම්පාදනය කරන ලද කාර්යාල උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් ස්ථාවර පිරිවැය යටතේ දක්වනවා වෙනුවට වර්ධන මෙහෙයුම් පිරිවැය යටතේ දක්වා තිබුණි.

(ආ) ණය අංක 1993,2275 සහ 2276 යටතේ ක්‍රියාත්මක වූ වෙනත් ව්‍යාපෘතින් වෙනුවෙන් රු. මිලියන 2.7 ක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබූ බව නිරීක්ෂණය වූ අතර එය ව්‍යාපෘතියේ වරධන මේහයුම් පිරිවැය යටතේ වැරදි සහගත ලෙස ඇතළත් කර තිබුණි.

(ඇ) ණය අංක 1993 යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියේ සේවය කළ නිළධාරීන්ට අදාළව පාරිතෝෂික සඳහා රු. මිලියන 5.5 ක වෙන්කිරීමක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර තිබුණි.

(ඈ) ව්‍යාපෘතියේ ශ්‍රී ලංකා රජයේ දායක මුදලින් රු. මිලියන 1.1 ක දේපළ, පිරියත සහ උපකරණ හා වෙනත් පරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදීගෙන තිබූ අතර එය ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලයේ ප්‍රදේශිය කාර්යාලවල ප්‍රයේජනයට ගෙන තිබුණි.

(ඉ) ණය මුදලින් අයකර ගැනීමට හිමිකම ඇති කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකුට ගෙවිය යුතුව තිබූ රු. 11,435,028 ක මුදලක් මහා භාණ්ඩාගාරයේන් ලැබිය යුතු දායකයක් ලෙස අනුචිත ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 6. මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය හා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් දිනය සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **සැපයීම සඳහා එකඟවූ මුදල** | | **2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය** | **සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල්** | **2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල්** | |
|---|---|---|---|---|---|---|
| | **එජඩො (මිලියන)** | **රු.(මිලියන)** | **රු.(මිලියන)** | **රු.(මිලියන)** | **එජඩො (මිලියන)** | **රු.(මිලියන)** |
| ආසබැ | 13.30 | 1,206.30 | 417.00 | 414.72 | 6.8 | 870.03 |
| ශ්‍රී ලංකා රජය | 4.57 | 511.00 | 277.03 | 197.88 | 2.1 | 276.37 |
| එකතුව | **17.87** | **1,717.30** | **694.03** | **612.60*** | **8.9*** | **1146.4*** |

* උපචිත වියදම්වල බලපෑම හේතුවෙන් ඉහත දැක්වෙන සංඛ්‍යා මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යා වලින් වෙනස් වේ.

### 6.2 භෞතික කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සැලසුම් කරන ලද කාලය තුළ වෙන් කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරුවන පරිදි සමස්ත ව්‍යාපෘති කාලය ආවරණය වන ලෙස මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආකාරයෙන් වගකීම් පවරමින් මූල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක සැලැස්මක් පිළියෙල කළ යුතුය. එවැනි සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) දේශිය අරමුදල් රු. 1,213,378,199 ක්ද, විදේශිය අරමුදල් එ.ජ.ඩො 4,214,369 ක් වශයෙන් ඇස්තමේන්තු කරන ලද මුදලකට මුතුර්හි ප්‍රධාන ඉදිකිරීම්, පිරිසිදු නොකල ජල සම්ප්‍රේෂණය හා පවිත්‍රාගාරය PA2 සඳහා කොන්ත්‍රාත්තු පිරිනමා තිබු අතර එය 2013 දෙසැම්බර් 20 දින නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. මෙම කොන්ත්‍රාත්වල භෞතික කාර්ය සාධනය 2013 දෙසැම්බර් 31 දිනට සියයට 75 ක් පමණක් වු අතර කොන්ත්‍රාත් කාලය 2014 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

(ඇ) පිරිපහදු කරන ලද ජලය බෙදාහැරීම සඳහා වු ප්‍රධන ජලනල සැපයුම සහ ඇතිරිම ( කි.මී. 10.5) හා සම්ප්‍රේෂණ පවිත්‍රාගාර තුළුමුව දෙකක් සඳහා වන කොන්ත්රාත් රු. 1,162,504,731 ක් වැයකර වසර දෙකක් ප්‍රමාද වී 2011 සැප්තැම්බර් 30 දින ව්‍යාපෘතිය විසින් නිමකර තිබුණද අදාළ කොන්ත්‍රාත්තුවට හා සමාන්තරව නිමකළ යුතුව තිබු පිරිසිද නොකළ ජල සම්ප්‍රේෂණ පවිත්‍රා ගාරය හා පිරිසිදු කළ ජලනල ගත කිරීම් වලට අදාළ වෙනත් කොන්ත්‍රාත්තු නිම නොකිරීමහේතුවෙන් 2013 දෙසැම්බර් 31 දින වනවිටත් නිෂ්ක්‍රීයව පැවතුණි.